**තිහගොඩ ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 24 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු ජූලි 26 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට තිහගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1. ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ සභාවට ලැබී තිබූ රු.200,000 ක ආයුර්වේද ද්‍රව්‍ය ආධාර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලට ගෙන තිබූ එකතුව රු.1,045,570 ක් වූ නාම පුවරු, යන්ත්‍ර සහ උපකරණ, මෝටර් රථ හා කරත්ත සහ ලී බඩු හා සවිකිරීම් ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) ගලබඩ ප්‍රජාශාලාව, කෝමංගොඩ සහ කෝට්ටවත්ත සුසානභූමි දෙක හා තිහගොඩ බස් නැවතුම අසල ඉඩම යන වත්කම් අගය කර ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් කර තිබූ රු.192,915 ක් වූ රඳවුම් තැන්පතු මුදල් වලට අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් නොකර තවදුරටත් ගිණුම්වල දක්වා තිබුණි.

(ඉ) ගල්හේන්ගොඩ මැන්ඩෝරය මාර්ගය සකස් කිරීම වෙනුවෙන් ගෙවා තිබූ රු.242,500 ක වියදම අඩු නොකර ඇස්තමේන්තුගත රු.1,000,000 ක මුදල කර්මාන්ත ණයහිමි යටතේ දක්වා තිබුණි

(ඊ) සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කර තිබූ එකතුව රු.9,017,348 ක් වූ ගොඩනැගිලි 05 ක වටිනාකම් ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනීත කර නොතිබුණි.

(උ) ඉකුත් වර්ෂයන්ට අදාළ එකතුව රු. 273,890 ක් වූ හිඟ විගණන ගාස්තු වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 10 කට අදාළ ශේෂ සහ ඊට අදාළ උපයෝගී ලේඛන සහ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු.5,623,314 ක් විය.

### 1.3.3 අවිනිශ්චිත ගිණුම

නිරවුල් කිරීමට පියවර නොගෙන වර්ෂ කීපයක සිට ඉදිරියට ගෙනෙමින් පවතින අවිනිශ්චිත ගිණුමේ වූ රු. 2,382,841 ක බැර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

### 1.3.4 ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 84,238,318 ක් වූ විවිධ ණයගැති ශේෂය තුළ අවුරුදු 03 ක කාලයක් ඉක්මවා තිබූ රු. 60,412,156 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

### 1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

එකතුව රු.69,364,618 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය, හිමිකම් ඔප්පු හා උපලේඛනද, එකතුව රු.11,378,932 ක් වූ විවිධ ණයහිමි ශේෂ හා රු.86,621,962 ක් වූ ණයගැති ශේෂ සම්බන්ධයෙන් විධිමත් හා යාවත්කාලීන කරන ලද උපලේඛන, කාල විශ්ලේෂණ හා එකතුව රු.95,669 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් අත්තිකාරම් ලේඛනය යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා, විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 පරිදි වර්ෂ 05 ක කාලයක් ඉක්මවල ලද එකතුව රු.185,605 ක් ගෙවිය යුතු රඳවුම් තැන්පතු ශේෂ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.5,029,840 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.13,499,054 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,469,214 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 86.8 ක් තරම් මුළු පුනරාවර්තන වියදම් පැවතුණි

(ආ) සභාවේ ස්වයං උත්පාදන ආදායම ඉක්මවා වර්ෂ තුනෙහිම සැලකිය යුතු අගයන්ගෙන් පුනරාවර්තන වියදම් වැඩිවී තිබුණු අතර සභාවේ ස්වයං උත්පාදන ආදායම්වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි තත්ත්වයක් පෙන්නුම් කෙරුණි.

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ණයගැති ශේෂය තුළ වසර 03 ක කාලයක් ඉක්මවා අය නොවී පවතින එකතුව රු.60,412,156 ක් වූ ශේෂ පැවතීමෙන් ජංගම හා ක්ෂණික අනුපාතයන් ප්‍රකාරව ද්‍රවශීලතා තත්ත්වයක් නොපවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.4 ආදායම් පරිපාලනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

### 2.4.1 වරිපනම්

2013 වර්ෂයේ අගෝස්තු 13 දිනැති අංක 1824 දරන ගැසට් නිවේදනය මගින් සභා බල ප්‍රදේශය දියුණු ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කර තිබුණද, එදින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සභාව විසින් වරිපනම් බදු අයකිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර නොතිබුණි.

### 2.4.2 බදු කුලී

ආරම්භක හිඟ කඩ කුලී ශේෂය රු.221,264 ක් වූ අතර, වර්ෂය සඳහා රු.914,700 ක බිල් කිරීම් සමඟ රු.1,135,964 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.913,575 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.222,389 ක ශේෂයක් හිඟව පැවතුණි.

### 2.4.3 ජල ගාස්තු ආදායම්

ආරම්භක හිඟ ශේෂය රු.143,620 ක් වූ අතර, වර්ෂය සඳහා රු.249,089 ක බිල් කිරීම් සමඟ රු.392,709 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් 225,043 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.167,666 ක් හිඟව පැවතුණි.

### 2.4.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.222,334 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.10,557,575 ක් අයවිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) සභාවට අයත් රු. 5,850,000 ක් වූ ඉඩම්වල අයිතිය තහවුරු වන ආකාරයේ පියවරක් ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණ අතර සභාව විසින් මිලදී ගෙන තිබූ කුරුඳු වගාව සහිත අක්කර 01 ක ඉඩමේ කොටසක, අනවසරයෙන් පදිංචිව සිටි පුද්ගලයෙකු

නිවාස 02 ක් ඉදිකර, දේපලද භුක්ති විඳිමින් පැවති නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) තෘතීයික, ද්විතීයික, ප්‍රාථමික යන තනතුරු සඳහා බඳවා ගෙන තිබූ 17 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, ස්ථිර නොවූ කාර්යමණ්ඩල වැටුප් හා දීමනා ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු .4,874,923 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

## 3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජන වත්කම්

----------------------------------------

වර්ෂයකට වැඩි කාලයක් තිස්සේ කාබනික පොහොර හලන යන්ත්‍රයක් හා අඩි 30x14x12 ප්‍රමාණයේ හරිතාගාරයක්ද, වර්ෂයකට වැඩි කාලයක් තිස්සේ ද නිෂ්ක්‍රීයව පැවති අතර සභාව සතු යටියන ළිඳ පිහිටි ඉඩමද, කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා ගෙන නොතිබුණු අතර, පිරිවැය රු.100,000 ක් වූ අත් ට්‍රැක්ටරයක්ද අක්‍රීයව පැවතුණි.

## 3.3 කොන්ත්‍රාත් පාලනය

------------------------

සමාලෝචිත වර්ෂය තුළ නව ගොඩනැගිල්ලේ උද්‍යානය සහ නව ආදාහනාගාරයේ උද්‍යානය අලංකරණය කිරීම සඳහා රු.1,084,000 ක ගෙවීම් කර තිබුණි. අදාල කර්මාන්ත 02 සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකසා ගිවිසුම්ගත වී නොතිබුණ අතර, කොන්ත්‍රාත්කරුට වැඩිපුර රු.129,496 ක මුදලක් ගෙවා තිබුණි.

## 3.4 පාරිසරික ගැටළු

-----------------

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් රු.6,333,600 ක වියදම් දරා තිබුණ අතර, සභාව විසින් බල ප්‍රදේශයෙන් එකතු කරනු ලබන කසළ, කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා යොදා ගැනීමෙන් පසු ඉතිරි වන අපද්‍රව්‍ය සහා බල ප්‍රදේශයේ නිල්වලා ගඟ ආශ්‍රිතව පෞද්ගලික පාර්ශවයකට අයත් වගුරු බිමකට මුදා හැරීම නිසා, නිතර ගංවතුර ගැලීම් සිදුවන, ජලජ ශාක හා සතුන්ගෙන් යුක්ත අවට පරිසරයට හානි සිදුවෙමින් පවතින බව නිරීක්ෂණය විය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

### 4.1 අයවැය පාලනය

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් ආදායම් විෂයයන් 05 ක ළඟා කර නොගත් ආ ඉලක්කගත ආදායම රු. 31,210,906 ක්ද, වැය විෂයයන් 07 ක එකතුව රු.30,830,124 ක් වූ ඉතිරිවීම්ද පැවතීම යන හේතු නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2 අභ්‍යන්තර විගණනය

---

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 යන රෙගුලාසිවල දැක්වෙන විධි විධානයන් සහ දකුණු පළාත් පාළන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා /යහ/ 01/ න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබූ නමුත්, අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේදී රු.456,830 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

---

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ආදායම් රැස්කිරීම

(ඇ) අයවැය පාලනය